# හෝජාජානීය ජාතකය

තවද එක්සමයෙක්හි ජේතවනාරාමයෙහි වැඩවසන සර්වඥයන් වහන්සේ පසුබට විර්ය ඇති එක් මහණෙකු අරභයා මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි අප මහා බෝධිසත්වයෝ හොජාජානීය නම් සෛන්ධවයන්ට නායකව අස්රජව උපන්නහ. හෝජාජානීය නම් කුලයෙහි සෙසු අසුන්ට වැඩි තරම් උතුම්වූ ඒ අස්රජහු බරණැස්නුවර රජහට මගුලස්ව වෙසෙති ඔවුන් සිටිනා අශ්වශාලාව උඩුවියන් බැඳ බිත්ති සිතුයම් කරවා බිම සුදු වැලි අතුරණ ලද්දේය. මහබෝසතාණෝ එහි හෙළ කුඩයක් යටසිට මධුරවූ භෝජනය අනුභව කොට හැම අසුන්ට උතුම් ව වාසය කෙරෙති. එසමයෙහි සත් රජ්ජුරු කෙණෙක් ඒ බරණැස් රජ්ජුරුවන් හා යුධ කොට රාජ්‍යය ගණුම්හයි සටනට අවුත් බොහෝ සේනාව පිරිවරා පඤ්චායුධයෙන් සන්නද්ධව ඇත් අස් රථ ආදී මහත් කායබල සේනාව ගෙණ නුවර වටකොට සැරසී රැකසිටියාහුය. බරණැස්නුවර රජ්ජුරුවෝ තමන්ගේ අමාත්‍යයන් රැස්කොට එපවත් උන්ට කියා කළමනා කිම්දැයි කිවුය. එබස් අසා අමාත්‍යයෝ කියන්නාහු දේවයිනි. නුඹවහන්සේ පළමුකොට නොවැඩිය මැනව. නුඹ වහන්සේගේ මෙනම් රාවුතයාණ කෙණෙක් ඇත්තෝ වේද උන්ට පිරිස්පාවාදී ප්‍රසාදදී උන් යැව්ව මැනවයි කිවුය. රජ්ජුරුවෝ එපවත් අසා ඒ රාවුතයාණන් ගෙන්වාගෙණ කියන්නාහු දරුව අපගේ රාජ්‍යය ගණුම්හයි කියා අප හා සටන්කරන්නට රජ දරුවෝ සත්දෙනෙක් මහබලසෙනග ගෙණ රාජ්‍යය වටකොට රැකගත්හ. උන් සත්දෙනා හා කැටුව යුද්ධ කොට ගතහෙයි දැයි විචාළෝය. එපවත් අසා රාවුතයාණෝ ස්වාමීනි මට පිළිවනි නුඹ වහන්සේගේ මගුල් හොජාජානීය නම් අසු ලදිම් නම් යුද්ධකොට ජයගෙන දෙමියි කිවුය. රජ එපවත් අසා මාගේ රාජ්‍යය නැසීයාම සුදුසු නොවෙයි සිතා කැමති පිරිස් හා කැමති සෛන්ධවයකු ගෙණවයි සතුරනුත් සාධදෙවයි කිවුය. රාවුතයාණෝ සෛන්ධවයා හා සමග පිරිස් ගෙණ නික්ම සතුරන් සිටිතෙනට ආසන්නව සිට හෝජාජානීය නම් සෛන්ධවයානන් ඇළයට ගොස් සනහාලා ඇඟ අතගාලා තොපට ද මටද ස්වාමී වූ රජ්ජුරුවන්ට පක්ෂ පාතව සටන් කොට සතුරන් සාදාදෙවයි ඔවාතෙපුල් දී නොයෙක් රසයෙන් යුක්ත භෝජනය කවා මධුර පානය පොවා සුවඳ විලවුන් ගල්වා සන්නාහයක් ලා එහි රන්සැත්ලා වසා දැඩි කොට සාදාලා තෙමේ සැරහීගෙණ යන්නාහ. සන්නද්ධව මගුල්කඩුව ගෙණ අසුට නමස්කාර කොටලා පිටට පැන නැගී යුද්ධයට වන්නාහ. බෝධිසත්වයෝ සිතන්නාහු මේ සත් රජ්ජුරුකෙණෙකුන් තබා මුළු දඹදිව සෙනඟ අවුත් කම් කිම් ද උන් නොමරා ඇල්ලූ කල වේද සුරකමෙයි සිතා සබඳ ආශ්චාචාරිය රජ දරුවන් නොමරා යුද්ධය මට බාරයයි කිවුය. ඒ අශ්වචාරි තෙමේ සාහසිකව සතුරු සෙනඟ මදධ්‍යයට වන් සඳ අශ්වයා පිනු පිනු තෙනට විදුලියක් මෙන් කඩුව  හිස සිසාරා නොබාහිඳ පළමු බලකොටුව බිඳපියා එක් රජ්ජුරුකෙනෙකුන් නොමරා අල්වාගෙණවුත් නුවරට පාවාදී නැවතත් බිහිසුණු  සතුරු සෙනඟ මැදට වැද සේනාව බිඳ පරාජය කොට ඒ රජුත් නොමරා ගෙණ සේනාවට පාවාදී මෙසේ ම සදෙනෙකු ගෙණ නැවත සත්වන රජහු අල්වන්ට බොහෝ සෙනඟ එක්ව සිටත් අසු මෙහෙයලා යුද්ධයට වන් සඳ අස්හු සතුරන් අතින් කඩු පහරක් ලදින් කඩු පහර කා ඇඟින් ලේධාරා ඉසින්නාහු අශ්චර්යයා බලා මහත් වූ භයශෝකයෙන් ආයේ ආපසු මෙහෙයලා රජගෙයි මිදුලට ගෙණ ගොස් සන්නාහය ලිහිල් කොට නැවත අනි අසකු සන්නාහය බඳින්නට වන. අස් තෙමේ කඩු පහර කෑ වේදනාවෙන් වැදහෙව සිතත්නේ මේ අශ්වාචාර්යය තෙමේ මාගේ ගුණ නොදන්නේය. සත්වෙනි බලකොටුව බිඳින්ට හා සත්වන රජු ගන්ට නික්මෙයි. අනික් අසකු සදයි. ආශ්චර්යයා සත්වන රජු ගන්ට නොපොහොසත. මේ තෙමේ ද මරණයට යයි. ආශ්වයාත් මරන්නේ රටත් නසන්නේය. රජුත් සතුරන්ට අසුවන්නේය. එසේවත් මා දෙවුනා රජහට කළ විර්ය නොපෙණෙයි. දියෙහි ඉරක් ඇන්දාසේ වෙයි. මා ඇර අන් අයෙක් මෙ සකල දඹදිව සත්වනා රජු ගන්නද බලකොටුව බිඳින්නටද නොපොහොසතැයි සිතා කෙළෙහි ගුණ දන්නා වූ මහබෝසතානන් වහන්සේ මෙසේ සිතූසේක. මේ රජ මා තිරිසන් නැනැත්තවුට බොහෝ උපකාර තබා දී මගුලස්ථනාන්තරයෙහි තමා මට නොයෙක් පොෂ්‍යකොට මා රක්ෂා කෙළේ නම් මෙසේ වූ යුද්ධයක් දුටුකලට වේද මා ඇඟින් වැගිරෙන ලේ රජු මට දුන් නොයෙක් රසයෙන් මධුරපානයෙන් අටගන්නතා වූ ලේ මුත් අනිත් ඇතිවූ ලෙයක් නොවෙයි, එබැවින් මාගේ ශරීරයෙහි රජු නිසා අටගත් මාංශයද ජීවිතයද රජුට දී පක්ෂපාතව ම මළෙම් නම් පරලොව සුවයෙක් ම ලැබෙයි. තමන් පිණිස මාගේ ජීවිතය සතුරන්ට දී පක්ෂපාතව මළ කල තිරිසන්ව සිට මට සතුරන් සාදා දී මා නිසා ජීවිතය දුන්හයි මාගේ රජු කී කල්හි මලාත් නොමළායයි සිතන සේක්, සබඳ අශ්වාචාර්යය සත්වන බලකොටුව හා එහි බිහිසිණු සතුරන් මැදට වදින්ට අනිත් අසෙක් මා මුත් මුළු දඹදිව නැතැයි හෝජාජානීය නම් වු සෛන්ධව කුලයෙහි උපන්නාවූ මා මුත් අනිත් අස් රජෙක් නැතැයි මා නගා සිටුවාගෙණ සන්නාහ බැඳ සත්වන රජු ගන්ට යවයි කී සේක. බෝධිසත්වයන්ගේ බස් අසා ආශ්චාචාර්යය තෙමෙ බෝධිසත්වයන් සමීපයට ගොස් නඟා සිටුවාගෙණ වණය වසා බෙහෙත් බැඳ පෙරසේම සන්නාහයලා අසුපිට පැනනැගී කඩුව ගෙණ මහත් බලකාය ගෙණ සතුරු සෙනඟ බිඳ සත්වන රජු අල්වාගෙණ මහත් බලකාය ගෙණ සතුරු සෙනඟ බිඳ සත්වන රජු අල්වාගෙන නොමරාම ගෙණත් පිරිසට පාවාදීලුයේය. සත්වන රජු හා සෙනඟ සාදා සතුරන් බිඳපියා පිරිස් ඇරගෙණ බෝධිසත්වයන් හා සමඟ රජගෙදෙරට අවුත් රජ්ජුරුවන් දුටුයේය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් කෙටුම් කෑ බව අසා මහත් වූ ශෝකයෙන් කම්පිතව සිටියාහ. බෝධිසත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියන්නාහු දේවයෙනි මේ රජ සත්දෙනා නොමරවයි දිවරවාපියා මිත්‍රව සිට උන් උන්ගේ රටට යවයි කීහ. මහරජ තොප මට කරණ උපකාර නම් තෙල අශ්වාචාර්යයට කළ මැනවැයි සත්කාර කරවා තොපිද නොපමාව දන්දෙව පෙහෙවස්

රකුව බණ අසව ප්‍රාණවධ නොකරව දශරාජ ධර්මයෙන් රාජ්‍ය කරවයි. අවවාද කොට බෝධිසත්වයෝ තුමූ සන්නාහය මුදාපීකල පරලොව ගියහ. රජ්ජුරුවෝ මහත් ශෝකයෙන් හඬා කම්පිතව බෝධිසත්වයන් මහත් වූ පෙළහරින් පූජාකොට ආදාහණ කරවූහ. බෝධිසත්වයන් කී පරිද්දෙන් රජ්ජුරුවෝ සිත තබා ආශ්වාචාර්යයාහට බොහෝ වස්තු ද ගම්බිම් ද තනතුරුද දී මිත්‍රද්‍රෝහී නොවී රක්ෂාස්ථානයෙහි තුබූ සේක. නැවත බෝධිසත්වයන් කී අවවාද සිත තබා තමන්ට ද්‍රෝහී වූ රජසත්දෙනා ගෙන්වාගෙණ නොමරා නාවා ආහාර අනුභව කරවා සත්දෙනා දිව්රවා උන් උන්ගේ රටට යවා තුමුද බෝධිසත්වයන් කී පරිද්දෙන්ම තමන් කළ කුශලමූලයෙන් දෙව්ලොව උපන් නාහුය. ශාස්තෘන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි. පෙර නුවනැත්තාවූ මහොත්තමයෝ විර්ය කරන්නට සුදුසුතන්හි වීර්ය කළාහුය. මෙබඳු ප්‍රහාර ලැබගෙණ ද විර්ය නොහැරියාහුය. තෙපි වනාහී මෙබඳු නෛර්යානිණික ශාසනයෙහි මහණව කවර කාරණයෙකින් විර්ය හැරියේහි දැයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළ සේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි පසුබට විර්ය ඇති මහණතෙම අර්හත්ඵලයෙහි පිහිටිසේක. බුදුරජානන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ භෝජාජානීය ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිර වූ සේක. අශවාචාර්යය ශාරීපුත්තස්ථවිර වුයේය. භොජජානීය සෛනධවාශව ව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.